තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව - 2020

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, කොමිෂන් සභාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය කොමිෂන් සභාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

කොමිෂන් සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, කොමිෂන් සභාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.4** මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

-----------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාර විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ කොමිෂන් සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ කොමිෂන් සභාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, කොමිෂන් සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

---

**1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය**

---

ගනුදෙනු කළමනාකාරිත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරිබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරිත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

**1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම**

---

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2014 වර්ෂයේ දී කොමිෂන් සභාව විසින් පරිත්‍යාග වශයෙන් ලබා දී තිබූ පිරිවැය රු. 5,760,324 ක් වූ වත්කම් ගිණුම්වලින් ඉවත් නොකිරීමේ වරද ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 3 හි 47 ඡේදය පරිදි සංසන්දනාත්මක අගයන් නැවත ප්‍රකාශ කිරීමෙන් හෝ අතීතානුයෝගීව ගැලපීමෙන් නිවැරදි කල යුතු වුවද එයට පටහැනිව සමාලෝචිත වර්ෂය තුළදී පොත් වලින් ඉවත් කර තිබුණි. ඒ හේතුවෙන් එම වත්කම්වලට අදාලව 2015 වර්ෂයේ සිට 2019 වර්ෂය | 2014 මැයි මස 12 වන දින පරිත්‍යාග කරනු ලැබූ වත්කම් වල අගය 2020 වර්ෂය දක්වා පොත් වලින් ඉවත් කර නොමැති බැවින් 2014 සිට 2019 වසර දක්වා ක්ෂය වශයෙන් ගණනය වූ වටිනාකම සහ ඒ නිසා සමුච්චිත ලාභයට වූ බලපෑම 2021 වර්ෂයේ මූල්‍ය වාර්ථාවල සටහනක් ලෙස හෙළිදරව් කිරීමට පියවර ගනිමි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත පරිදි සංසන්දනාත්මක අගයන් නැවත ප්‍රකාශ කිරීමෙන් හෝ අතීතානුයෝගීව ගැලපීමෙන් නිවැරදි කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | දක්වා වූ කාලපරිච්ඡේදයට අදාළ එකතුව රු. **1,881,720** ක් වූ ක්ෂය අදාළ වර්ෂයන්හි ලාභයෙන් අඩු වී තිබීම හේතුවෙන් එම ප්‍රමාණයෙන් සමුච්චිත ලාභය අඩුවෙන් හා සමුච්චිත ක්ෂය වැඩියෙන් දක්වා තිබුණි. | | |
| (ආ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත **7** හි **47** ඡේදය ප්‍රකාරව දේපල පිරියත හා උපකරණවල සාධාරණ අගය වෙනස්වීම මත ප්‍රත්‍යාගණනයන් සිදුකල යුතු වුවත්, මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු ශුද්ධ අගය රු. **19,472,941** ක් වූ වත්කම් සම්බන්ධයෙන් **2008** වර්ෂයෙන් පසුව ප්‍රත්‍යාගණනයක් සිදුකර නොතිබුණි. | වත්කම් කාණ්ඩ අනුව ප්‍රත්‍යාගණනය කිරීම පිණිස කමිටු **03**ක් පත්කර ඇත. ඒ අනුව ප්‍රත්‍යාගණන කාර්යය සිදුවන බව සඳහන් කරමි.ප්‍රත්‍යාගණනයෙන් පසු අදාල වාර්ථා විගණනය වෙත ඉදිරිපත් කරමි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත පරිදි ප්‍රත්‍යාගණනයන් සිදුකල යුතුය. |
| (ඇ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත **8** හි **22** ඡේදය ප්‍රකාරව නෛතික බැඳීමේ ප්‍රමාණය විශ්වාසදායී ලෙස ඇස්තමේන්තුකල හැකි විටක, මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදන සැලසිය යුතුය. එසේ වුවද, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව වෙත ගෙවියයුතු රු. **3,102,571** ක් සඳහා සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල වෙන්කිරීම් සිදුකර නොතිබුණි. | **2020** වර්ෂයට අදාළව ගිණුම් පිළියෙල කිරීමේ දී මෙම ගෙවිය යුතු අගය පිලිබඳව තොරතුරු ගිණුම් අංශයට ඉදිරිපත් නොවුනු හෙයින් අදාල වගකීම සඳහා වෙන් කිරීමක් සිදුකළ නොහැකිවිය. ඒ අනුව **2021** වර්ෂයේදී ඒ සඳහා අදාල වන ගිණුම් සටහන් යෙදවීමට පියවර ගනිමි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත පරිදි මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදන සැලසිය යුතුය |

### 1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඉකුත් වර්ෂයට අදාල එකතුව රු. **477,859** ක් වූ වියදම් පෙර වර්ෂයේ ලාභයට ගැලපීම වෙනුවට සමාලෝචිත වර්ෂයේ වියදම් ලෙස ගැලපීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අතිරික්තය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | **2021** වසරට අදාළව ගිණුම් පිළියෙල කිරීමේදී මේ පිළිබඳ හෙළිදරව් කිරීමට පියවර ගනිමි. | වර්ෂයට අදාල වියදම් නිවැරදිව හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | **2020** දෙසැම්බර් **31** දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ඇතුළත් රු. **5,384,000** ක් වූ අත්තිකාරම් ශේෂය තුල **2017** වර්ෂයේ සිට පවතින රු. **1,879,170** ක් වූ හඳුනා නොගත් අත්තිකාරම් ශේෂයට අදාල උපලේඛන විගණනයට ඉදිරිපත් නොකෙරුණි | අත්තිකාරම් ශේෂය තුළ ඇතුලත්ව ඇති රු. **1,879,170** ක් වූ ශේෂය පිළිබඳව විස්තරාත්මක උපලේඛනය ඉදිරිපත් කිරීමට පියවර ගනිමි. | අදාල උපලේඛන විගණනයට ඉදිරිපත් නොකෙරුණි. |

**1.6** නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| | (i) මුදල් රෙගුලාසි **396** | බැංකු ගිණුම් දෙකකට අදාලව වලංගු කාලය ඉක්මවා මාස **6** සිට වසර **4** දක්වා කාලයක් ගත වී ඇති එකතු වටිනාකම රු. **6,868,602** ක් වූ චෙක්පත් **593** ක් සම්බන්ධයෙන් යොමුගත රෙගුලාසිය පරිදි කටයුතු කර නොතිබුණි. | නිකුත් කර ඇතත් ගෙවීම සඳහා ඉදිරිපත් නොවූ චෙක්පත් මු.රෙ අනුව නිවැරදි කිරීමට පියවර ගෙන ඇත. | මුදල් රෙගුලාසි වලට අනුකූලව කටයුතු කළ යුතුය. |
| | (ii) මුදල් රෙගුලාසි **188(2)** | කොමිෂන් සභාවේ බැංකු ගිණුම් දෙකකට අදාලව වසර 1 සිට වසර 5 ක් දක්වා කාලය තුල තැන්පත් කල නමුත් උපලබ්ධි නොවූ එකතුව රු 5,025,693 ක් වූ අවස්ථා **448** ක් සම්බන්ධයෙන් අදාල රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මු.රෙ. අනුව නිවැරදි කිරීමට පියවර ගෙන ඇත. | මුදල් රෙගුලාසි වලට අනුකූලව කටයුතු කළ යුතුය. |
| | (iii) මුදල් රෙගුලාසි **753** | රජයේ පාසලක් වෙත පරිත්‍යාග ලෙස ලබාදී තිබූ පිරිවැය රු. **5,760,324** ක් වූ භාණ්ඩ අදාල පාසලෙන් භාරගත් බවට ලිඛිත සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | අදාල භාණ්ඩ භාරගත් බවට තහවුරු කිරීමේ ලිපියක් එවන ලෙස පුලියන්කුලම ප්‍රාථමික විද්‍යාලය වෙත දන්වා යවා ඇත. එය ලද විගස විගණනය වෙත ඉදිරිපත් කිරීමට පියවර ගනිමි. | මුදල් රෙගුලාසි පරිදි කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | අනුමත බඳවාගැනීමේ පටිපාටිය හා 2016 අගෝස්තු 15 දිනැති අංක DMS/1675-VII දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ ලිපිය | අදාල සේවා කාලය සම්පූර්ණ කර නොතිබූ නිලධාරීන් 04 දෙනෙකු සඳහා අධ්‍යක්ෂ තනතුරු පිරිනමා තිබුණු අතර ඉන් එක් නිලධාරියෙකු අධ්‍යක්ෂ තනතුරට අවශ්‍ය පශ්චාත් උපාධිය ලබාගෙන නොතිබුණි. | මෙම නිලධාරීන් ආයතනයට බඳවා ගන්නා විට පැවති බඳවා ගැනීමේ පටිපාටියට අනුව මෙම කොමිෂන් සභාවේ නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුරට බඳවා ගෙන ඇත. 2012 වන විට මෙම ආයතනයේ සහකාර අධ්‍යක්ෂ තනතුරක් නොතිබූ අතර 2012.05.11 දින අනුමත බඳවා ගැනිමේ පටිපාටියට අනුව නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුරට ඍජු බඳවා ගැනීමක් කළ නොහැකි විය. සහකාර අධ්‍යක්ෂ තනතුරෙහි සිට උසස්වීම් ලැබිය යුතුය. | කළමනාකරණ සේවා දෙපාර්තමේන් තුවේ උපදෙස් අනුව කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2009 නොවැම්බර් 13 දිනැති අංක 438 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | රජයේ ආයතනවල ගොඩගැසී ඇති අපහරණය කලයුතු භාණ්ඩ කඩිනමින් අපහරණය කලයුතු වුවත් කොමිෂන් සභාව මඟින් රු. 8,071,885 ක් වටිනාකමින් යුත් භාණ්ඩ අයිතම 212 ක් අවුරුදු 05 සිට අවුරුදු 08 අතර කාලයක සිට කාර්යාල පරිශ්‍රයේ ගොඩගසා තිබුණි. | නිසි ටෙන්ඩර් ක්‍රියාවලිය අනුගමනය කරමින් මෙම භාණ්ඩ අපහරණය කිරීමට පියවර ගනිමි. | රාජ්‍ය මුදල් චක්‍රලේඛය අනුව කටයුතු කළ යුතුය. |
| (ඈ) | 2015 ජූලි 14 දිනැති අංක 3/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයෙන් සංශෝධිත ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 371(2)(ආ) රෙගුලාසිය | විශේෂිත කාර්යයක් සඳහා එක් අවස්ථාවකදී රු. 100,000 ක උපරිමයක් දක්වා පමණක් තත්කාර්ය අතුරු අග්‍රිමයක් ලබාදිය හැකි වුවත් ඊට පටහැනි ලෙස භාණ්ඩාගාර අනුමැතියකින් තොරව රු. 5,239,895 ක් තත්කාර්ය අතුරු අග්‍රිමයක් සමාලෝචිත වර්ෂයේදී ලබාදී තිබුණි. | රට තුල පැවති වාතාවරණය මත මහා භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ වාචික අනුමැතිය මත මෙම අත්තිකාරම් විභාග කටයුතු සඳහා ලබා දුන් අතර ලිඛිත අනුමැතිය ලබාගැනීමට කඩිනමින් පියවරගන්නා ලෙස අදාල නිලධාරින්ට උපදෙස් දී ඇත. | මුදල් රෙගුලාසි පරිදි කටයුතු කළ යුතුය. |
| (ඉ) | 2018 පෙබරවාරි 15 දිනැති අංක 01/2018 දරන චක්‍රලේඛය හා | යොමුගත චක්‍රලේඛය පරිදි රාජ්‍ය සංස්ථා සහ ව්‍යවස්ථාපිත ආයතනයන්හි ජ්‍යෙෂ්ඨ | විධායක මට්ටමේ වසර 08 මාස 04 දින 19 ක සේවා කාලයක් සහිත | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ |

| | | | | |
|---|---|---|---|---|
| | 2020 ජනවාරි 27 දිනැති අංක TIP/SS/01/27 දරන වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍රලේඛය | විධායක මට්ටමේ වසර 12 ක සක්‍රීය සේවා කාලයක් ඇති නිලධාරියෙකුට සහනදායී පදනම මත මෝටර්රථ බලපත්‍රයක් ලබාදිය හැකි වුවත් ඊට පටහැනි ලෙස අදාල විධායක මට්ටමේ වසර 08 මාස 04 දින 18ක සේවා කාලය සහිත නිලධාරියෙකුට සහනදායී මෝටර්රථ බලපත්‍රයක් ලබාදී තිබුණි. | නිළධාරියෙකුට සහනදායී පදනම මත මෝටර් රථ බලපත්‍රයක් ලබා දී තිබුණු බව පිලිගන්නා අතර ඉදිරියේදී මෙවැනි දෝෂයන් සිදු නොවනසේ කටයුතු කරන ලෙස අදාල නිලධාරින්ට උපදෙස් දී ඇත. | යුතුය. |
| (ඊ) | 1990 අංක 20 දරන තෘතියික හා වෘත්තීය අධ්‍යාපන පනත හා 1990 අංක 50 දරන (සංශෝධන) පනත | කොමිෂන් සභාවේ බලතල යටතේ වෘත්තීය අධ්‍යාපනය හා පුහුණුව පිළිබඳව කරන පර්යේෂණ හා සංවර්ධන ක්‍රියාකාරකම් භාරගැනීමට පමණක් බලතල පවරා තිබිය දී සභාවේ අරමුදල් භාවිතා කරමින් පර්යේෂණ සිදු කරමින් පැවතුණි. | මහාභාණ්ඩාගාරයෙන් පර්යේෂණ සඳහා ප්‍රතිපාදන සලසා තිබුණද ලබාදී තිබූ ප්‍රතිපාදන සීමිත බැවින් SSDP ව්‍යාපෘතිය මගින් වෙන්කරන ලද අයවැය ඇස්තමේන්තුවේ පර්යේෂණ සඳහා වෙනම වැය විෂයක් එනම් DLI (Disbursement Link Index) එකක් ස්ථාපනය වී තිබූ හෙයින් , එසේ වෙන් කරන ලද මුදල් පර්යේෂණ සඳහා උපයෝගි කරගන්නා ලදි. | පනතෙන් පවරා ඇති බලතල අනුව කටයුතු කළ යුතුය. |
| (උ) | ශ්‍රී ලංකාවේ වෘත්තීය පුහුණු සුදුසුකම් රාමුව සඳහා වූ මෙහෙයුම් අත්පොත ( National Vocational Qualification Frame Work of Sri Lanka, Operation Manual - 2009)<br>(i) 3.1.1 වගන්තිය | නිපුණතා සම්මත සකස් කර ඇතත් පාඩම්මාලා සකස් කර නොමැති ක්ෂේත්‍ර හා වෘත්තීන් 66 ක් නිරීක්ෂණය විය. | විෂයමාලා සකස්කර නොමැති ක්ෂේත්‍ර සඳහාද විෂයමාලා සකස්කරන ලෙස අධ්‍යක්ෂ (ජා.වෘ.සු.) වෙත උපදෙස් දී ඇත. | කඩිනමින් විෂයමාලා සකස්කල යුතුය. |
| | (ii) 3.1.7 වගන්තිය | නිපුණතා සම්මත වර්ෂ 03 කට වරක් හෝ වේගයෙන් වෙනස් වන තාක්ෂණික ක්ෂේත්‍ර ඊට වඩා අඩු කාලයක් තුල යාවත්කාලීන කල යුතු වුවත් ක්ෂේත්‍ර 11 කට අදාල නිපුණතා සම්මත හා පාඩම්මාලා වසර 01 සිට වසර 10 දක්වා කාලයක සිට යාවත්කාලීන කර නොතිබුණි. | මෙතෙක් යාවත්කාලින නොකරන ලද විෂයමාලා යාවත්කාලින කිරිම සඳහා කඩිනම් ක්‍රියාමාර්ග ගන්නා ලෙස අධ්‍යක්ෂ (ජා.වෘ.සු.) වෙත උපදෙස් දී ඇත. | නිපුණතා සම්මත යාවත්කාලීන කිරීමට ක්‍රියා කලයුතුය. |

**2.** මූල්‍ය සමාලෝචනය

**2.1** මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. **22,164,882** ක අතිරික්තයක් අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. **-14,567,899** ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. **7,596,983** ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට, රු**28,916,994** කින් ආදායම අඩුවී තිබුණද මෙහෙයුම් වියදම් හා ව්‍යාපෘති වියදම් රු.**35,142,813** කින් අඩුවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3.** මෙහෙයුම් සමාලෝචනය

**3.1** කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කොමිෂන් සභාවේ **2012** ජූලි **17** දින කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමත කර තිබුණු බඳවාගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය අවස්ථා රාශියකදී සංශෝධනය කර තිබීම හේතුවෙන් ඒම සංශෝධන සියල්ල ඇතුලත් බඳවාගැනීමේ හා උසස්කිරීමේ පරිපාටියක් සකස් කර අනුමත කරවා ගන්නා ලෙස **2016** අගෝස්තු **15** දින කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් කොමිෂන් සභාව වෙත දන්වා තිබුණද **2020** නොවැම්බර් **10** දින දක්වාම ඒ අනුව කටයුතු කර නොතිබුණි. | වර්තමාන බඳවා ගැනීමේ පරිපාටිය කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ උපදෙස් පරිදි සංශෝධනය සඳහා අභ්‍යන්තර කමිටුවක් පත්කර අභ්‍යන්තර සාකච්ඡා පවත්වා සංශෝධනයන් කර ඇති අතර කොමිෂන් සභාවේ අනුමැතිය ලබාගැනීමෙන් අනතුරුව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට නියමිතය. | කඩිනමින් සංශෝධන සියල්ල ඇතුලත් බඳවාගැනීමේ හා උසස්කිරීමේ පරිපාටියක් සකස් කර අනුමත කරවා ගත යුතුය. |